# සංඝ රත්නයට බෙහෙත් පූජා කිරීමෙන් නිවන තෙක් ඔබට ලැබෙන විපාක

## පිළින්දිවච්ඡස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 572 - 573)

පදුමුත්තර බුදු රජාණන් වහන්සේ ඇතුළු මහා සංඝ රත්නයට බෙහෙත් පූජා කළ හංසවතී නුවර වාසය කළ දොරටුපාලයෙකුට එතැන් සිට නිවන් දකින තුරු උපන් හැම භවයක ම මෙම ආනිසංස ලැබුණා.

- දීර්ඝායුෂ ලැබුවා.
- බල ඇත්තෙක් වුණා.
- වීරත්වයෙන් යුතු වුණා.
- සිවි වර්ණය ලැබුණා.
- කීර්තිමත් අයෙක් වුණා.
- සැප ලැබුවා.
- උවදුරු ඇති වුණේ නැහැ.
- විපත් වලින් මිදුණා.
- අන් අයගෙන් පුද පූජා ලැබුවා.
- කැමති අයගෙන් වෙන්වීමේ දුක ලැබුවේ නැහැ.

අවසන් භවයේ දී ගෞතම බුදු සසුනේ පැවිදි ව සියලු කෙලෙසුන් නසා නිවනින් සැනසුණා.